# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2016 අංක 11 දරන ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත

---

**[සහතිකය සටහන් කළේ 2016 ජූලි මස 27 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2016 ජූලි මස 29 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 14.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2016 අංක 11 දරන ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත

[සහතිකය සටහන් කළේ 2016 ජූලි මස 27 වන දින]

එල්.ඩී.-ඕ. 28/2014

**ශ්‍රී ලංකාව තුළ විද්‍යා සහ තාක්ෂණ පර්යේෂණ සංස්කෘතියක් සහ ප්‍රජාවක් අභිවර්ධනය කිරීමේ සහ තහවුරු කිරීමේ කාර්යය සඳහා සහ ජාතික සංවර්ධන න්‍යායපත්‍රයට දායක වන පර්යේෂණ වැඩ සටහන් සඳහා පහසුකම් සැලැස්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සභාවක් පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2016 අංක 11 දරන ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු ''නියමිත දිනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය. — *ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

### I වන කොටස

### ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පිහිටුවීම

2. (1) (මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. — *ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පිහිටුවීම.*

(2) (1) වන උපවගන්තිය මගින් සභාවට ලබා දී ඇති නාමයෙන් එය සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

**3.** සභාව පිහිටුවා ඇත්තේ යම් අරමුණු සඳහා ද ඒ අරමුණු මෙසේ විය යුතු ය:— — *සභාවේ අරමුණු.*

(අ) රට තුළ උද්දීපිත විද්‍යා සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැගීම සඳහා විද්‍යාවට සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ පහසු කිරීම සඳහා ආණ්ඩුවට සහාය වීම;

2—PL 009948—2,861 (2016/05)

(ආ) ජාතික අවශ්‍යතාවලට දයක වන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීමට හැකි වන පරිදි උසස් අධ්‍යාපන ආයතනවල, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනවල සහ වෙනත් රාජ්‍ය ආයතනවල විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඊට පහසුකම් සැලසීම; සහ

(ඇ) විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ වැඩි දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝග ඉල්ලා සිටීම.

සභාවේ සංයුතිය.

**4.** (1) සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යඃ-

(අ) (මෙහි මින් මතු ''පත්කළ සාමාජිකයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) විද්‍යාව සහ තාක්ෂණයට සහ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයන්හි පුළුල් දැනුමක් සහ පළපුරුද්දක් ඇති විද්‍යාඥයන් අතරින් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් දස දෙනකුට නොවැඩි සංඛ්‍යාවක්;

(ආ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්ඃ-

(i) විද්‍යා සහ තාක්ෂණ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්; සහ

(ii) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්.

(2) පත්කළ සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් සභාවේ සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන යටතේ සභාව විසින් එහි බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

**5.** එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ අරමුණු ඉටු කර ගැනීමේ දී තත් කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ විධානවලට සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ සම්බන්ධයෙන් රජයේ සාමාන්‍ය ප්‍රතිපත්තියට ද අනුකූලව සභාව ක්‍රියාකළ යුතු ය.

**6.** යම් තැනැත්තකු—

*සභාවේ සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම්.*

(අ) පාර්ලිමේන්තුවේ, යම් පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු හෝ සභිකයකු වන්නේ නම් හෝ එසේ මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකා පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකු වීම අවසන් වේ නම්; හෝ

(ඇ) සභාවේ සාමාජිකයකු ලෙස තම කාර්තව්‍ය ඉටු කිරීමේ දී ඊට අහිතකර බලපෑමක් ඇතිවිය හැකි මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් එම තැනැත්තාට ඇත්නම්; හෝ

(ඈ) පිළිගත හැකි හේතුවක් නොමැතිව අඛණ්ඩව සභාවේ රැස්වීම් තුනකට සහභාගි නොවී සිටීනම්; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ එම තැනැත්තා සිහිවිකල් පුද්ගලයකු බවට අනාවරණය කරනු ලැබුවහොත් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත්; හෝ

(ඊ) එම තැනැත්තා ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයන් ගත කරමින් සිටී නම්, හෝ ගත කර ඇත්නම්,

එම තැනැත්තා සභාවේ සාමාජිකයකු ලෙස පත්කිරීමට හෝ සාමාජිකයකු වශයෙන් දිගටම රැඳී සිටීමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

*නිලබලයෙන් පත්වන සාමාජිකයන්.*

**7.** සභාවේ නිලබලයෙන් පත්වන සෑම සාමාජිකයෙක් ම එම සාමාජිකයා සභාවට පත් කරනු ලැබුවේ යම් ධුරයක් ප්‍රකාරව ද එම ධුරය දරන තාක් කල් ධුර දැරිය යුතු ය.

*පත්කළ සාමාජිකයන්ට අදාළ විධිවිධාන.*

**8.** (1) සභාවේ සෑම පත්කළ සාමාජිකයෙක් ම, මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම යන හේතු නිසා කලින් ධුරය අත්හලහොත් මිස, පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුතු අතර, එම සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාවේ යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ යම් පත්කළ සාමාජිකයකු විසින් තත් කාර්ය සඳහා අමාත්‍යවරයා අමතනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක දී ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් එම ලිපිය ලිඛිතව පිළිගනු ලැබූ විට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(4) (අ) යම් පත්කළ සාමාජිකයකු මියයෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරය හිස්කරනු ලැබුවහොත් අමාත්‍යවරයා විසින් (4)(1) වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය;

(ආ) එම තැනැත්තා වෙනුවට එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(5) සභාවේ යම් පත්කළ සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ ශාරීරික දුබලතාවක් නිසා හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා එම සාමාජිකයාට තාවකාලිකව තම ධුරයේ කාර්ය ඉටු කළ නොහැකි වන අවස්ථාවක එම සාමාජිකයා විසින් එම නොහැකියාව පිළිබඳව අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. ඉන්පසු අමාත්‍යවරයා විසින් (4)(1) වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම කාලසීමාව තුළ ඔහු වෙනුවට ක්‍රියාකිරීම සඳහා වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය.

සභාපතිවරයාගේ ධුර කාලය ආදිය.

**9.** (1) සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව බාර ගැනීමෙන් පසු බලාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා හේතු දක්වා ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මෙම ඡේදය යටතේ සභාපතිවරයා සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබූ විට එම නියමය ගැසට් පත්‍රයේ

පළ කරනු ලැබූ දින සිට සභාපතිවරයා ධුරය අත්හැර ගියා සේ සලකනු ලැබිය යුතු ය.

(3) රෝගාතුර වීම, ශාරීරික දුබලතාව හෝ මාස තුනකට නොඅඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට තාවකාලිකව තම ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකිවන අවස්ථාවක සභාපතිවරයා විසින් එම නොහැකියාව පිළිබඳව අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. අමාත්‍යවරයා විසින් සභාපතිවරයා සේවයට නොපැමිණෙන කාලය තුළ ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා 4(2) වගන්තිය යටතේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(4) මියයෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම යන හේතු මත සභාපතිවරයා ධුරය හිස්කරනු ලබන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 4(2) වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු පත්කරනු ලැබිය හැකි අතර, එසේ පත්කරනු ලබන සභාපතිවරයා තමා අනුප්‍රාප්තවන සභාපතිවරයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(5) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය ඔහු සභාවේ සාමාජිකයකු ලෙස ධුර දරන කාලය විය යුතු ය.

**10.** සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා හෝ සභාවේ සාමාජිකයකු පත් කිරීමේ දී යම් දෝෂයක් තිබීම නිසා හෝ පමණක්, සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

සභාවේ යම් පුරප්පාඩුවක් තිබීම මගින් හෝ සාමාජිකයකු පත් කිරීමේ දී දෝෂයක් තිබීම හේතු කොටගෙන සභාවේ ක්‍රියා හෝ කටයුතු නිර්බල නොවිය යුතු බව.

**11.** මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ආදිය.

සභාවේ රැස්වීම්.

**12.** (1) අවම වශයෙන් සෑම මාස දෙකකට වරක් හෝ සභාවේ රැස්වීමක් පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාපති හෝ ඔහු නොපැමිණි විට පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරා පත්කරගනු ලබන සාමාජිකයකු හෝ සභාවේ රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය.

(3) සභාවේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වූ සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද ප්‍රමාණය සමාන වුවහොත් මුලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හය දෙනකු වියයුතු අතර, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව සභාව විසින් එම රැස්වීම්වල කාර්යපටිපාටිය නියාමනය කළ හැකි ය.

සභාවේ මුද්‍රාව.

**13.** (1) සභාවේ මුද්‍රාව සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට විය යුතු ය.

(2) සභාවේ මුද්‍රාව—

(අ) සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය;

(ඇ) සභාවේ අවසරය නොමැතිව සහ සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් එම සාමාජිකයන් දෙදෙනා එම සාධන පත්‍රයට අත්සන් තබනු ලබන අවස්ථාවක දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

I වන කොටස

**සභාවේ බලතල හා කර්තව්‍ය**

සභාවේ කර්තව්‍ය.

**14.** සභාවේ කර්තව්‍ය—

(අ) සභාවේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්යය සඳහා විද්‍යාවට සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ පැවැත්වීම සඳහා ප්‍රදාන ලබා දීම;

(ආ) පර්යේෂණ සඳහා වූ රජයේ ආයෝජන කාර්යක්ෂම ලෙස උපයෝගී කිරීම සහතික කිරීම පිණිස, උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන සහ වෙනත් රජයේ ආයතනවලට සපයනු ලබන ප්‍රදාන සම්බන්ධයෙන් විද්‍යාව හා තාක්ෂණයට අදාළ පර්යේෂණ පහසුකරලීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ නියාමනය කිරීම;

(ඇ) සභාවේ කාර්යය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආනයනය කිරීම සහ සභාවේ කාර්ය කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා පිළිගත් දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් උපකරණ, අරමුදල් සහ වෙනත් සහාය ලබා ගැනීම;

(ඈ) විද්‍යාව සහ තාක්ෂණය සහ ඒ හා ආශ්‍රිත විෂයන්ට අදාළ පර්යේෂණ පිළිබඳ වාර්තා, වාර වාර්තා සහ ලිපි එකතු කිරීම, මුද්‍රණය කිරීම සහ පළ කිරීම;

(ඉ) දේශීය හෝ විදේශීය විද්‍යා සහ තාක්ෂණ ආයතනවල දී විද්‍යාත්මක අධ්‍යයනය හෝ විද්‍යාත්මක වැඩ සඳහා ශිෂ්‍යත්ව සහ එම ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් ලැබීමට දෙනු ලබන ශිෂ්‍යත්ව පිරිනැමීම;

(ඊ) විද්‍යාවට සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ සහ නව නිපැයුම් පිළිගැනීම සඳහා සහ සම්මාන ප්‍රදානය සඳහා ජාතික ක්‍රමවේදයක් සකස් කිරීම; සහ

(උ) විද්‍යාව සහ තාක්ෂණය සහ ආශ්‍රිත විෂයයන්ට අදාළ පර්යේෂණ පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම,

විය යුතු ය.

15. සභාවට— *සභාවේ බලතල.*

(අ) සභාවේ කාර්ය සඳහා යම් නිශ්චල හෝ චංචල දේපළ මිල දී ගැනීම, අත්කර ගැනීම සහ දැරීම සහ එම දේපළ විකිණීම, බදුදීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම;

(ඇ) එහි බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලුම එවැනි

ගිවිසුම්වලට දේශීය හෝ විදේශීය පුද්ගලයන් හෝ ආයතන සමග ඇතුළත් වීම;

(ඈ) සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් සුරැකුම්පත්වල වහා අවශ්‍ය නොවන එහි අරමුදල් ආයෝජනය කිරීම;

(ඉ) සභාවේ කර්තව්‍ය කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍යවන අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, බලපත්‍ර සහ අධිකාරී බලය අත්කර ගැනීම;

(ඊ) විද්‍යාව සහ තාක්ෂණයට අදළ නිශ්චිත ව්‍යාපෘති මත පර්යේෂණ ආරම්භ කිරීමට හෝ පවත්වාගෙන යාමට පුද්ගලයන්ට, විද්‍යාඥයන්ට හෝ යම් ආයතනයකට හෝ අධිකාරියකට ප්‍රදාන ලබා දීම;

(උ) සභාවේ වැඩවල ඕනෑම අංශයක් සම්බන්ධයෙන් සභාවට සහාය වීම සඳහා ක්‍රියාකාරී කමිටු පිහිටුවීම, එම කමිටුවල විෂය පථය අර්ථකථනය කිරීම සහ අමාත්‍යවරයාගේ අනුමතය මත එම කමිටුවලට තැනැත්තන් පත් කිරීම;

(ඌ) අවශ්‍ය විය හැකි සභාවේ කටයුතු පරිපාලනය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම;

(එ) සභාව විසින් ලබා දෙනු ලබන යම් සේවා සඳහා ගාස්තු, රාජ්‍ය භාග හෝ පිරිවැය අය කිරීම; සහ

(ඒ) සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත්, සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහාත් අවශ්‍ය වන හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා ඉටු කිරීම,

සඳහා බලය තිබිය යුතු ය.

III වන කොටස

**සභාවේ ප්‍රධාන විධායක නිලධරයා සහ කාර්ය මණ්ඩලය පත්කිරීම**

සභාවේ ප්‍රධාන විධායක නිලධරයා.

**16.** (1) අමාත්‍යවරයා විසින් සභාව විමසා එවැනිම ආකාරයකට නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යා උපාධියක් හිමි තැනැත්තකු සභාවේ ප්‍රධාන විධායක නිලධරයා ලෙස පත්කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන විධායක නිලධරයා සභාවේ විධානවලට යටත්ව සභාවේ කටයුතුවල පරිපාලනය සහ සභාවේ කාර්ය මණ්ඩලයේ විනය පාලනය භාරව කටයුතු කළ යුතු ය. සභාව විසින් ඔහුට පනවනු ලැබිය හැකි වෙනත් යම් කර්තව්‍ය ද ඔහු විසින් ඉටු කරනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන විධායක නිලධරයා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, එම කාලසීමාව ඔහුගේ පත්වීමේ දිනයේ සිට අවුරුදු පහක් නොඉක්මවිය යුතු අතර, අමාත්‍යවරයා විසින් සභාව විමසා ප්‍රධාන විධායක නිලධරයාගේ ධුර කාලය තුළ ඔහුගේ ධුරයේ කටයුතු කිරීම සැලකිල්ලට ගෙන ඔහු නැවත එම තනතුරට පත් කරනු ලැබිය හැකි ය.

(4) සභාවේ යම් රැස්වීමකට පැමිණ තම මතය ප්‍රකාශ කිරීමට ප්‍රධාන විධායක නිලධරයාට හිමිකමක් ඇති නමුත් එවැනි යම් රැස්වීමක දී ඡන්දය පාවිච්චි කිරීමට ඔහුට හිමිකමක් නොතිබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා හේතු දක්වා ප්‍රධාන විධායක නිලධරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

17. (1) සභාව විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව— සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම ආදිය.

(අ) සභාවේ කර්තව්‍ය කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන නිලධරයන් සහ අනිකුත් සේවා නියුක්තයන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි අතර, එම නිලධරයන්ගේ හෝ සේවා නියුක්තයන්ගේ හෝ විනය පාලනය කිරීම හෝ ඔවුන් සේවයෙන් පහ කිරීම කරනු ලැබිය හැකි ය;

(ආ) අමාත්‍යවරයා විමසා මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික සහ වෙනත් ප්‍රතිලාභ එම නිලධරයන්ට සහ අනිකුත් සේවා නියුක්තයන්ට ලබා දිය හැකි ය;

(ඇ) එහි නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ ප්‍රතිලාභය උදෙසා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවා නියාමනය කළ හැකි අතර, එම අරමුදල්වලට හෝ යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14(2) වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14(3) වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති තැනැත්තකු සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක දී ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා එම තැනැත්තා සභාවේ සේවය කරන කාලසීමාව ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### මූල්‍ය

සභාවේ අරමුදල.

18. (1) සභාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, එම අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු යː-

(අ) සභාවේ ප්‍රයෝජනය සඳහා කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණ;

(ආ) පනත යටතේ සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සභාවට ලැබෙන සියලු මුදල්;

(ඇ) සභාවේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත යම් ඕනෑම ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ හෝ ප්‍රදාන වශයෙන් සභාවට ලැබිය හැකි සියලු මුදල්; සහ

(ඈ) මේ පනත යටතේ ගාස්තු, රාජ්‍යභාග හෝ අය කිරීම් වශයෙන් සභාවට ලැබිය හැකි පරිදි වූ සියලු මුදල්.

(2) සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, සහ ඉටු කිරීමේ දී සභාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**19.** (1) සභාවේ වත්කම් සහ බැරකම්, ආදයම් සහ වියදම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි පරිදි ගිණුම් පොත් තැබීමට සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය. සභාවේ ගිණුම් විගණනය කිරීම.

(2) සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) සභාවේ ගිණුම් විගණනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

### V වන කොටස

### සාමාන්‍ය

**20.** (1) සභාව විසින් එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස හයක් ඇතුළත එම මුදල් වර්ෂය තුළ සභාව විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු අතර, එම වර්ෂයට අදාළ පහත දැක්වෙන එක් එක් ලේඛනයේ පිටපතක් එම වාර්තාවට අමුණා තිබිය යුතු යː- වාර්ෂික වාර්තාව.

(අ) එම වර්ෂය සඳහා වූ විගණනය කරන ලද සභාවේ ගිණුම් සමග විගණකාධිපතිවරයාගේ වාර්තාව;

(ආ) එම වාර්තාවට සහ ගිණුම්වලට අදාළ වර්ෂයට ඉක්බිතිවම එළඹෙන වර්ෂය සඳහා වූ යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක්.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවේ සහ ලේඛනවල පිටපත් එම වාර්තාව සහ ලේඛන ලැබුණු දින සිට මාස හයක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

**21.** සභාවේ යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් අවශ්‍යවන අවස්ථාවක දී එම කාර්යය (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්ය සඳහා පොදු කාර්යයක් ලෙස සලකනු සභාව සඳහා අනිවාර්යයෙන් ඉඩම් අත්කර ගැනීම.

ලැබිය යුතු අතර, ඒ අනුව එකී ඉඩම්, සභාව සඳහා ආණ්ඩුව විසින් ඒ අයුරින් පනත යටතේ අත්කර ගනු ලැබිය යුතු අතර, එම අත්කර ගැනීමට සහ ඒ සම්බන්ධයෙන් එම පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

සිවිල් හෝ අපරාධ නඩුවලින් සාමාජිකයන් සහ නිලධරයන් ආරක්ෂා කිරීම.

**22.** (1) මේ පනත යටතේ සභාව වෙත පනවා ඇති හෝ පවරා ඇති යම් කර්තව්‍යයක් හෝ බලතල කිසිවක් ඉටු කිරීමේ දී හෝ කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී සද්භාවයෙන් කරන ලද කිසිවක් සඳහා කිසිම සිවිල් හෝ අපරාධ වගකීමක් සභාවේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට නැතහොත් එම සාමාජිකයා හෝ නිලධරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකුට ආරෝපණය නොකළ යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරිපිට යම් අදාළ අධිකාරියක් විසින් හෝ යම් අධිකාරයකට එරෙහිව පවරනු ලබන සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාව විසින් දරනු ලබන යම් වියදමක් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාවට ගෙවන ලද හෝ සභාව විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ අවස්ථාවෝචිත පරිදි සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ එම සාමාජිකයා හෝ නිලධරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට එම තැනැත්තාට එරෙහිව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන ලද වියදම් එකී ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් එම වියදම් අයකර ගනු ලැබුවේ නම් මිස, සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මැදිහත් වීම හෝ අනිසි බලපෑමක් සිදු කිරීම ආදිය වරදක් බව.

**23.** (1) මේ පනත යටතේ සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ නිලධරයකු විසින් මේ පනත යටතේ යම් බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කිසිම තැනැත්තකු විසින් එම සාමාජිකයාගේ හෝ නිලධරයාගේ කටයුතුවලට මැදිහත්වීම සඳහා හෝ බාධා කිරීම සඳහා කිසිවක් නොකළ යුතු අතර, එම සාමාජිකයාට හෝ නිලධරයාට අනිසි බලපෑමක් හෝ බලකිරීමක් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් පනවන ලද තහනම උල්ලංඝනය කරමින් ක්‍රියාකරන යම් තැනැත්තෙක් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී ඔහු රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**24.** දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සභාවේ සියලු නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. සභාවේ නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**25.** අල්ලස් පනතේ අර්ථානුකූලව සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය. අල්ලස් පනතේ කාර්ය සඳහා සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**26.** (1) සභාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය රීති සභාව විසින් සාදනු ලැබිය හැකි ය. රීති.

(2) සභාව විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ එම රීතියේ නිශ්චිතව දක්වනු ලබන පසු දිනයක සිට ක්‍රියාත්මක භාවයට එළඹිය යුතු ය.

**27.** නියමිත දින සිට සහ එදිනට පසුව- ශේෂ කිරීම්.

(අ) 2007 ජූලි මස 24 වන දින ජනාධිපති නියෝගයක් යටතේ පිහිටුවනු ලැබුවා වූ (මෙහි මින් මතු ''ජාතික පර්යේෂණ සභාව'' යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික පර්යේෂණ සභාව විසින් සිය අරමුණු ඉටු කර ගැනීමේ දී මේ දක්වා සිදු කරනු ලැබුවා වූ ද මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ (මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ අරමුණුවලට අනනුකූල නොවන්නා වූ ද ජාතික

පර්යේෂණ සභාවේ සියලු ක්‍රියාකාරකම් මේ පනත යටතේ ඉටු කිරීමට නියමිත ක්‍රියාකාරකම් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ ක්‍රියාකාරකම් සභාව විසින් දිගටම සිදු කළ යුතු ය;

(ආ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජාතික පර්යේෂණ සභාවට අයත්ව තිබූ සියලු චංචල සහ නිශ්චල දේපළ නියමිත දින සිට බලපවත්වන පරිදි සභාව වෙත පවරනු ලැබිය යුතු ය;

(ඇ) ජාතික පර්යේෂණ සභාව විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබූ නියමිත දිනට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවතින සියලු සිවිල් නඩු, අපරාධ නඩු, නඩු, නීති කෘත්‍යයන්, කාරණා හෝ දේවල් සභාව විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබූ සිවිල් නඩු, අපරාධ නඩු, නඩු, නීති කෘත්‍යයන්, කාරණා හෝ දේවල් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව දිගටම පවත්වාගෙන යා හැකි අතර, එසේ අවසන් කළ යුතු ය;

(ඈ) යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් ඉහත කී ජාතික පර්යේෂණ සභාවේ වාසියට හෝ ඊට එරෙහිව ඇතුළත් කරන ලද හෝ ප්‍රකාශ කරන ලද යම් තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රදානයක් නියමිත දින සිට බලපවත්වන පරිදි සභාවේ වාසියට හෝ ඊට එරෙහිව ප්‍රකාශ කරන ලද තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය;

(ඉ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ජාතික පර්යේෂණ සභාවේ සියලු නිලධරයන් හා සේවා නියුක්තයන්, නියමිත දින සිට බලපවත්වන පරිදි ජාතික පර්යේෂණ සභාවේ සේවා නියුක්තයන්ට අදාළ කොන්දේසිවලට වඩා වාසිදායක බැවින් අඩු නොවන කොන්දේසි මත, සභාවේ නිලධරයන් සහ සේවා නියුත්තයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජාතික පර්යේෂණ සභාවට උපචිත වූ සියලු ණය, බැඳීම්, වත්කම් සහ බැරකම් ද ලියා අත්සන් කළ හෝ බලාත්මක කරනු ලබන සියලු කොන්ත්‍රාත් හෝ ගිවිසුම් ද ජාතික පර්යේෂණ සභාව විසින් හෝ එය සමඟ ඉටු කරන බවට එකඟ වූ සියලු කාරණා හෝ දේ ද ඉහත කී ජාතික පර්යේෂණ සභාව විසින් හෝ එකී ජාතික පර්යේෂණ සභාව වෙත නිකුත් කරන ලද සියලු බලපත්‍ර ආදිය ද නියමිත දිනයේ සිට සභාව විසින් හෝ එය වෙනුවෙන් දරන ලද ණය, බැඳීම්, වත්කම් හා බැරකම් වශයෙන් ද ලියා අත්සන් කළ හෝ බලාත්මක කරනු ලබන කොන්ත්‍රාත් හෝ ගිවිසුම් ලෙස ද ඉටු කරන බවට එකඟ වූ කාරණා සහ දේ වශයෙන් ද සහ සභාව විසින් හෝ එය වෙත නිකුත් කරන ලද බලපත්‍ර වශයෙන් ද සලකනු ලැබිය යුතු ය.

**28.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ:- අර්ථ නිරූපණය.

''අමාත්‍යවරයා'' යන්නෙන්, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වේ.

**29.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක දී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.